*සැ. යු.* - (1) 2015.09.04 වැනි දින පළ වූ අංක 1,931 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.
(2) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* කොටසේ 2015 වර්ෂය සඳහා කුරුණෑගල සහ කුලියාපිටිය අධිකරණ කලාපවලට අයත් ජූරි සභික නාමාවලියක් භාෂාත්‍රයෙන් ම පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,932 - 2015 සැප්තැම්බර් මස 11 වැනි සිකුරාදා - 2015.09.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | — |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 262 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 ඔක්තෝබර් මස 02 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 සැප්තැම්බර් මස 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය* *www. documents.gov. lk* *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

259- B 80982 - 302 (2015/09)
E -1

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

**අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, පහත නම් සඳහන් 14 දෙනෙකු විසින්, ඒ හා දක්වා ඇති විස්තරවලට අදාළ ඉඩම් කැබලි කෘෂිකාර්මික කටයුතු සඳහා දීර්ඝකාලීන බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට සහ පහත සඳහන් කොන්දේසි වලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

*(අ)* *බදු කාලය* : අවුරුදු තිහයි. (30) (1995.06.15 සිට ඉදිරියට);

*(ආ)* *වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 1995 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි. මෙම බදුමුදල සෑම අවුරුදු 05 කට වරක් ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අය කළ මුදලින් 50% කට නොඅඩු විය යුතු ය. ;

*දඩ මුදල* .- ඉඩමේ දියුණු වටිනාකමින් 4% මෙන් තුන් ගුණයකි;

*(ඇ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුණ දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය;

*(ඈ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වගා කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය;

*(ඉ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

*(ඊ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(ඌ)* අවුරුදු 05 ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් කළ නොහැක ;

*(එ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එස්. ඒ. කලානි එම්. ධනසේකර,
සහකාර ඉඩම් කොමසාරිස්,
*ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට.*

2015 අගෝස්තු මස 14 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාරේ අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

| *අනු. අංකය* | *ඉ. කො. ජ. අංකය* | *නම* | *ග්‍රාම නිලධාරී කොට්ඨාසය* | *අනුරේඛණය* | *කැබලි අංකය* | *ප්‍රමාණය* | *සතර මායිම් උතුරට* | *නැගෙනහිරට* | *දකුණට* | *බස්නාහිරට* |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. | 4/10/30238 | වලහේනේ ගෙදර චන්ද්‍ර සේන | කන්තලේ නගරය | ජනපද නිලධාරී අනුරේඛනය | බී | පර්චස් 10 | කැබලි අංක A හා අතුරු පාර | අතුරු පාර හා උපතිස්ස පෙරේරාගේ ඉඩම | කැබලි අංක 4145 න් කොටසක් | කැබලි අංක A හා ප්‍රධාන පාර |

| අනු. අංකය | ඉ. කො. ජ. අංකය | නම | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | අනුරේඛණය | කැබලි අංකය | ප්‍රමාණය | සතර මායිම් උතුරට | නැගෙනහිරට | දකුණට | බස්නාහිරට |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2. | 4/10/30244 | මඩිත්තේ ගෙදර සුමනසිරි | හාතියගම | ජනපද නිලධාරී අනුරේඛනය | බී | පර්චස් 75 | පාර | දුම්රිය රක්ෂිතය | කැබලි අංක ඒ හා R අබේරත්නගේ ඉඩම | කැබලි අංක A හා එම්. ජී. පියුමාවතීගේ ඉඩම |
| 3. | 4/10/30621 | පෝද්දුව කංකානම්ගේ පියතිලක | 227 එල් හාතියගම | ජනපද නිලධාරී අනුරේඛනය | බී | පර්චස් 38 | එච්. එම්. සුනිල් ශාන්තගේ ඉඩම | එම්. ජී. පුංචි බණ්ඩාගේ ඉඩම | අංක A දරන ඉඩම | ඩබ්. ඒ. හේමන්තගේ ඉඩම |
| 4. | 4/10/30968 | තේනුවර හැන්නදිගේ ශිරාන් ඉන්දික | 227 කන්තලේ නගරය | ජනපද නිලධාරී අනුරේඛනය | 7824 සී | හෙක්. 0.0441 | කැබලි අංක 3286 | කැබලි අංක 7824/B | කැබලි අංක 7825 | කැබලි අංක 7823 |
| 5. | 4/10/30976 | නාය කෝරා-ළලාගේ අබේ-මැණිකේ මිය | 227 එල් හාතියගම | ජනපද නිලධාරී අනුරේඛනය | සී | පර්චස් 40 | ටී. ජී. ගාමිණිගේ ඉඩම | ඒ. කරුණා-රත්නගේ ඉඩම | කුණ ඇල | අතුරු පාර |
| 6. | 4/10/30979 | දොඹගහ පතිරණලාගේ අරුණ කිත්මාල් | 227 එල් හාතියගම | ජනපද නිලධාරී අනුරේඛනය | 6228/ බී | හෙක්. 0.0752 | කැබලි අංක 6201 ඉඩම | කැබලි අංක 6228/A දරන ඉඩම හා කැබලි අංක 6227 දරන ඉඩම | කැබලි අංක 6195 දරන ඉඩම, පාර හා කැබලි අංක 6228/A දරන ඉඩම | කැබලි අංක 6229 දරන ඉඩම |
| 7. | 4/10/30981 | විමලසූරිය මුදියන්සේලා-ගේ උදය ශ්‍රී බණ්ඩාර | 227 කන්තලේ නගරය | ජනපද නිලධාරී අනුරේඛනය | 3985/ බී | පර්චස් 09 | කැබලි අංක 3985 | කබැලි අංක 3985/A | කැබලි අංක 3991 | කැබලි අංක 3986 |
| 8. | 4/10/30983 | මැලැව්ව තන්ත්‍රිගේ සෝමරත්න | 227 කන්තලේ නගරය | ට්‍රි/කේ. එන්. ටී. 2015/507 | බී | හෙක්. 0.1415 | කැබලි අංක 8983 දරන ඉඩම, ප්‍රාදේශීය සභා පාර, අංක A දරන ඉඩම | ප්‍රාදේශීය සභා පාර, අංක A දරන ඉඩම, ආර්. පියතිස්-සගේ ඉඩම | එන්. ඩබ්. සීතාගේ ඉඩම, අංක A දරන ඉඩම, ආර්. පියතිස්සගේ ඉඩම | එන්. ඩබ්. සීතාගේ ඉඩම, කේ. එච්. ප්‍රේමරත්නගේ ඉඩම, අංක A දරන ඉඩම |
| 9. | 4/10/30984 | කළුආරච්චි මල්වඩම්ගේ නන්දිකා රෝෂණී ජයවර්ධන | යුනිට් 04 රජඇල | ජනපද නිලධාරී අනුරේඛනය | බී | පර්චස් 29.5 | කැබලි අංක 824 කුණු ඇල | කැබැලි අංක 823 | කැබලි අංක 823 හා A | කැබලි අංක 823 |
| 10. | 4/10/30985 | හරක්ගම ගෙදර නිමල් ජයසිංහ | හාතියගම | ජනපද නිලධාරී අනුරේඛනය | බී | පර්චස් 20 | කාර්මික පුහුණු මධ්‍යස්ථානය | අජිත් ශාන්තගේ ඉඩම | 01 වන පටුමග හා අංක A දරන ඉඩම | ජයසිංහගේ ඉඩම |
| 11. | 4/10/30987 | ඉල්ලවතුර මුදියන්සේ-ලාගේ නවරත්න බණ්ඩාර මයා | හාතියගම | ජනපද නිලධාරී අනුරේඛනය | බී | පර්චස් 30 | කැබලි අංක 6247 දරන ඉඩම | කැබලි අංක A දරන ඉඩම හා 6249 දරන ඉඩම | හය වන පටුමග හා කැබලි අංක A දරන ඉඩම | කැබලි අංක 6251 දරන ඉඩම |

| අනු. අංකය | ඉ. කො. ජ. අංකය | නම | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | අනුරේඛණය | කැබලි අංකය | ප්‍රමාණය | සතර මායිම් උතුරට | නැගෙනහිරට | දකුණට | බස්නාහිරට |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 12. | 4/10/30989 | අතපත්තුලාගේ පුංචි බණ්ඩා මයා | හාතියගම | ජනපද නිලධාරී අනුරේඛනය | බී | පර්චස් 30 | පළිගුමැණිකේ-ගේ ඉඩම හා කැබලි අංක A දරන ඉඩම | කැබලි අංක A දරන ඉඩම හා ලයිට් පාර | එල්. ජී. විජේ-සේකරගේ ඉඩම හා කැබලි අංක A දරන ඉඩම | ජී. එල්. රත්නසේකර-ගේ ඉඩම |
| 13. | 4/10/30993 | පුවක්ගොල්ල ගෙදර පොඩිමැණිකේ මිය | හාතියගම | ජනපද නිලධාරී අනුරේඛනය | 6346 බී | හෙක්. 0.0957 | කැබලි අංක 6346/A හා කැබලි අංක 6341 දරන පාර | කැබලි අංක 6341 පාර | කැබලි අංක 6373 දරන ඉඩම | කැබලි අංක 6345 දරන ඉඩම හා කැබලි අංක 6346/A දරන ඉඩම |
| 14. | 4/10/30994 | වාසල මුදියන්සේ-ලාගේ අබේ-රත්න මයා | හාතියගම | ජනපද නිලධාරී අනුරේඛනය | 6340/ බී | හෙක්. 0.0672 | කැබලි අංක 6393 දරන දරන ඉඩම | කැබලි අංක 6339 හා කැබලි අංක 6340/A ඉඩම | කැබලි අංක 6341 දරන පාර | කැබලි අංක 6393 දරන ඉඩම |

09-192

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/20088.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : එන්සීපී/පීඑල්සී/2005/10/ එම්ටී/04.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මිහින්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 572, හේනවත්ත ග්‍රාම නිලධාරී වසමේ, හේනවත්ත ගමේ, " ප්‍රමාණයෙන් පර්චස් 30ක් නේවාසික කටයුතු සඳහා කුරුප්පු අප්පුහාමිලාගේ දයාවතී මහත්මිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :-

| | | |
|---|---|---|
| *උතුරට* | : | යසපාල හේරත් මාවත රක්ෂිතය ; |
| *නැගෙනහිරට* | : | ඉඩමේම කොටසක් ; |
| *දකුණට* | : | පදිංචි ඉඩමේ කොටසක් ; |
| *බටහිරට* | : | අතුරු පාර රක්ෂිතය. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට සහ පහත සඳහන් කොන්දේසි වලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

*(අ)* *බදු කාලය :* අවුරුදු තිහයි. (30) (1995.06.15 සිට ඉදිරියට);

*වාර්ෂික බදු මුදල .-* ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 1995 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි;

*දඩ මුදල .-* ඉඩමේ දියුණු වටිනාකමින් 4% බැගින් වූ මුදල මෙන් තුන් ගුණයකි;

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුද්දක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය;

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම නේවාසික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය;

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(උ)* 2015.04.01 දින සිට වසර 05ක් ගතවන තුරු පවුල තුළ පැවරීම් හැර වෙනත් අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ. මෙම බදුකරය සඳහා දීමනා පත්‍රයක් ලබාගැනීමේ හිමිකම 2015.04.01 දින සිට වසර 05ක් ගතවීමෙන් පසු හිමි වේ ;

(ඌ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන් හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත;

(එ) නිවාස ඉදිකිරීම් කටයුතු සඳහා ඉඩම අන්සතු කිරීමේ දී නියම කරන ලද කාලසීමාව තුළ නිවාස කටයුතු සම්පූර්ණ කළ යුතු අතර, එසේ කිරීමට අසමත් වුවහොත් බදු ඔප්පුව අහෝසි වූවා සේ සැලකෙන අතර, රජය වෙත නැවත ඉඩම පැවරීමට සිදුවේ.

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එල්. පී. චාමිකා සුබෝධිනී,
සහකාර ඉඩම් කොමසාරිස් (ඉඩම්),
*ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට.*

2015 අගෝස්තු 25 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, ''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09-244

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/30117.
නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්ගේ අංකය : අනු/11/4/2/7/10.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මිහින්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, අංක 583, මහකනදරාව, යාය 1, ග්‍රාම නිලධාරී වසමේ, මහකනදරාව, යාය 01, වට ඉවුර ගමේ පිඹුරු අංක - කැබලි අංක - දරන ප්‍රමාණයෙන් පර්චස් 20ක් නේවාසික කටයුතු සඳහා රම්බණ්ඩාගේ ඉන්ද්‍රාණි සෙනෙවිරත්න මහත්මිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :-

| | | |
|---|---|---|
| *උතුරට* | : | රජයේ ඉඩම ; |
| *නැගෙනහිරට* | : | මාර්ග රක්ෂිතය ; |
| *දකුණට* | : | මාර්ග රක්ෂිතය ; |
| *බටහිරට* | : | ඉන්ද්‍රාණි සෙනෙවිරත්නගේ ඉඩම. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට සහ පහත සඳහන් කොන්දේසි වලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

(අ) බදු කාලය : අවුරුදු තිහයි. (30) (1995.06.15 සිට ඉදිරියට);

*වාර්ෂික බදු මුදල .-* ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 1995 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි;

*දඩ මුදල .-* ඉඩමේ දියුණු වටිනාකමින් 4% බැගින් වූ මුදල මෙන් තුන් ගුණයකි;

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුද්දක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය;

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම නේවාසික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය;

(ඈ) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

(ඉ) සෑදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

(උ) 2015.07.30 දින සිට වසර 05ක් ගතවන තුරු පවුල තුළ පැවරීම් හැර වෙනත් අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ. මෙම බදුරකරය සඳහා දීමනා පත්‍රයක් ලබාගැනීමේ හිමිකම 2015.07.30 දින සිට වසර 05ක් ගතවීමෙන් පසු හිමි වේ ;

(ඌ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන් හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත;

(එ) නිවාස ඉදිකිරීම් කටයුතු සඳහා ඉඩම අන්සතු කිරීමේ දී නියම කරන ලද කාලසීමාව තුළ නිවාස කටයුතු සම්පූර්ණ කළ යුතු අතර, එසේ කිරීමට අසමත් වුවහොත් බදු ඔප්පුව අහෝසි වූවා සේ සැලකෙන අතර, රජය වෙත නැවත ඉඩම පැවරීමට සිදුවේ.

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එල්. පී. චාමිකා සුබෝධිනී,
සහකාර ඉඩම් කොමසාරිස් (ඉඩම්),
*ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට.*

2015 අගෝස්තු 24 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, ''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09-243

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.